# 11 ශේෂ පිරික්සුම




මෙම පරිච්ඡේදය මගින් පහත දැක්වෙන කරුණු පිළිබඳ ව සාකච්ඡා කෙරේ.

11.1 ශේෂ පිරික්සුම හැඳින්වීම

11.2 මූලික පොත්වලින් ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම

11.3 ලෙජර් ගිණුම් තුලනය කිරීම

11.4 ශේෂ පිරික්සුම පිළියෙල කිරීම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## 11.1 ශේෂ පිරික්සුම හැඳින්වීම

ද්විත්ව සටහන් රීතිවලට අනුව ලෙජර ගිණුම් පිළියෙල කිරීමේ දී ගනුදෙනුවේ ද්විත්ව බලපෑම එක් ගිණුමක හරටත්, ඊට අදාළ අනෙක් ගිණුමේ බැරටත් සටහන් කරනු ලැබේ. ඒ අනුව ලෙජර් ගිණුම් තුලනය කළ පසු හර හා බැර වශයෙන් ශේෂ දක්නට ලැබේ. ද්විත්ව සටහන් රීතිවලට අනුව ගනුදෙනු ගිණුම්වල නිවැරදි ව සටහන් කර ගිණුම් තුලනය කළේ නම් එම ලැබෙන හර ශේෂ එකතුව සහ බැර ශේෂ එකතුව එකිනෙකට සමාන විය යුතු ය.

යම් කාලච්ඡේදයක් අවසානයේ දී ලෙජර ගිණුම්වල හර ශේෂ සහ බැර ශේෂ වෙන වෙන ම තීරු දෙකක ඇතුළත් කර පිළියෙල කරන ලැයිස්තුව ශේෂ පිරික්සුම වේ. මෙය ගිණුමක් නොවේ. එය ශේෂ ඇතුළත් ලේඛනයක් පමණක් වන අතර ලෙජරයේ සාරාංශයක් ලෙස සැලකිය හැකි ය.

සමාන අගයකින් ද්විත්ව සටහන් තබා ගිණුම් නිවැරදි ව තුලනය කළේ නම් එහි හර ශේෂ එකතුව සහ බැර ශේෂ එකතුව සමාන වේ. ඒ අනුව ශේෂ පිරික්සුමක හර ශේෂ එකතුව සහ බැර ශේෂ එකතුව සමාන වුවහොත් ඒ මගින් පහත සඳහන් කරුණු දෙක තහවුරු වේ.

1. ගිණුම්වලට හර කර ඇති අගය සහ බැර කර ඇති අගය සමාන බව
2. ගිණුම් නිවැරදි ව තුලනය කර ඇති බව (ගණිතමය නිවැරදිතාව ඇති බව)

**නිදසුන් ෑ-**

20XX.01.01 දින වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කළ ජනකාන්තගේ ව්‍යාපාරයේ 20XX.06.30 වන දිනට ලෙජර ගිණුම් තුලනය කර ලබාගත් ශේෂ පහත දැක්වෙන පරිදි වේ.

| | රු. |
|---|---|
| මුදල් | 40 000 |
| ගැනුම් | 150 000 |
| විකුණුම් | 365 000 |
| ණයගැතියෝ | 35 000 |
| ණයහිමියෝ | 24 000 |
| රක්ෂණ ගාස්තු | 6 000 |
| ලී බඩු | 20 000 |
| ලදවට්ටම් | 8 000 |
| දුන් වට්ටම් | 4 000 |
| මෝටර් රථ | 400 000 |
| කඩකුලී ගෙවීම් | 30 000 |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 5 000 |
| 12% ආයෝජන | 50 000 |
| ආයෝජන ආදායම් | 3 000 |
| 15% බැංකු ණය | 90 000 |
| 20XX.01.01 දිනට ප්‍රාග්ධනය | 250 000 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ඉහත ශේෂ ඇතුළත් කර පිළියෙල කරන ලද ශේෂ පිරික්සුම පහත දැක්වේ.

**ජනකාන්තගේ ව්‍යාපාරය**

20XX.06.30 වන දිනට ශේෂ පිරික්සුම

| විස්තරය | හර<br>රු. | බැර<br>රු. |
|---|---|---|
| මුදල් | 40 000 | |
| ගැනුම් | 150 000 | |
| විකුණුම් | | 365 000 |
| ණය ගැතියෝ | 35 000 | |
| ණය හිමියෝ | | 24 000 |
| රක්ෂණ ගාස්තු | 6 000 | |
| ලී බඩු | 20 000 | |
| ලද වට්ටම් | | 8 000 |
| දුන් වට්ටම් | 4 000 | |
| කඩකුලී ගෙවීම් | 30 000 | |
| මෝටර් රථ | 400 000 | |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 5 000 | |
| 12% ආයෝජන | 50 000 | |
| ආයෝජන ආදායම් | | 3 000 |
| 15% බැංකු ණය | | 90 000 |
| ප්‍රාග්ධනය | | 250 000 |
| | 740 000 | 740 000 |

## 11.2 මූලික පොත්වලින් ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීම

ගිණුම් කාල සීමාවක් තුළ දී ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු මූලික සටහන් පොත්වල වාර්තා කර ලෙජර ගිණුම්වලට පිටපත් කිරීම සිදු කෙරේ. ගනුදෙනු මූලික පොත්වල සටහන් කර ඒවා ලෙජරයට පිටපත් කරන ආකාරයත් එම ලෙජර ගිණුම් තුලනය කර ලබා ගන්නා ශේෂ ඇතුළත් කර ශේෂ පිරික්සුම පිළියෙල කරන ආකාරයත් පහත දැක්වෙන නිදසුන මගින් අධ්‍යයනය කරමු.

**නිදසුන :-**

සමනල ව්‍යාපාරයේ 20XX ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

**මුදල් ලැබීම් හා මුදල් ගෙවීම් ගනුදෙනු**

20XX.01.01 රු. 200 000කින් ව්‍යාපාරය ආරම්භ කරන ලදි.
01.02 අත්පිට ගැනුම් රු. 85 000ක් වේ.
01.03 රු. 20 000කින් බැංකු ජංගම ගිණුමක් ආරම්භ කරන ලදි.



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

01.04 බැංකු ණයක් මුදලින් ලැබුණා රු. 50 000.
01.05 අත්පිට විකුණුම් රු. 150 000කි.
01.08 කඩකුලී ගෙවීම් රු. 2 000කි.
01.10 ප්‍රියානිගෙන් (ණයගැතියෙකු) මුදල් ලැබුණා රු. 11 600කි. අඩුකළ වට්ටම රු. 400කි.
01.12 බැංකු ණය ගෙවීම් රු. 3 000කි.
01.20 ඉමාෂාගෙන් (ණයගැතියෙකු) රු. 9 000ක චෙක්පතක් ලැබිණ.
01.25 සුරංගිට (ණයහිමි) මුදල් ගෙවීම් රු. 7 600ක් වූ අතර අඩුකළ වට්ටම රු. 400කි.
01.26 විජිතට (ණයහිමි) රු. 12 000ක ණය ගෙවීමේදී 5% ක වට්ටමක් ලැබිණ.

**බැංකු ජංගම ගිණුම සමග සිදුකරන ලද ගනුදෙනු**

01.08 රු. 15 000ක චෙක්පතක් නිකුත්කර විකිණීමට භාණ්ඩ මිල දී ගත්තේ ය.
01.11 ප්‍රියානිගෙන් රු. 6 200ක චෙක්පතක් ලැබුණු අතර අඩුකරගෙන තිබූ වට්ටම රු. 300කි. මෙම චෙක්පත එදින ම බැංකුවේ තැන්පත් කරනු ලැබී ය.
01.18 කඩ කුලී සඳහා රු. 2000ක චෙක්පතක් නිකුත් කළේ ය.
01.27 ඉමාෂාගෙන් ජනවාරි මස 20 වන දින ලැබුණු චෙක්පත බැංකුවේ තැන්පත් කළේ ය.

**වෙළඳ භාණ්ඩ ණයට ගැනීම සම්බන්ධ ගනුදෙනු**

01.06 ඉන්වොයිස් අංක 45 යටතේ සුරංගිගෙන් රු. 24 000
01.08 ඉන්වොයිස් අංක 116 යටතේ විජිතගෙන් රු. 20 000

**වෙළඳ භාණ්ඩ ණයට විකිණීම සම්බන්ධ ගනුදෙනු**

01.05 ඉන්වොයිස් අංක 01 යටතේ ප්‍රියානිට රු. 19 000
01.09 ඉන්වොයිස් අංක 02 යටතේ ඉමාෂාට රු. 25 000

**අවශ්‍යවන්නේ**

20XX.01.31 න් අවසන් වූ මාසය සඳහා

01. වට්ටම් තීරු සහිත මුදල් පොත
02. වට්ටම් තීරු සහිත බැංකු ගිණුම
03. ගැනුම් ජ'නලය
04. විකුණුම් ජ'නලය
05. අදාළ ලෙජර් ගිණුම් සහ
06. 20XX.01.31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කිරීම

හර මුදල් පොත බැර

| දිනය | විස්තරය | වට්ටම් | මුදල් | දිනය | විස්තරය | වට්ටම් | මුදල් |
|---|---|---|---|---|---|---|---|
| 20XX.01.01 | ප්‍රාග්ධනය | | 200 000 | 20XX.01.02 | ගැනුම් | | 85 000 |
| 01.04 | බැංකු ණය | | 50 000 | 01.03 | බැංකු | | 20 000 |
| 01.05 | විකුණුම් | | 150 000 | 01.08 | කඩකුලී | | 2 000 |
| 01.10 | ප්‍රියානි (ණයගැති) | 400 | 11 600 | 01.12 | බැංකුණය | | 3 000 |
| 01.20 | ඉමාෂා (චෙක්) | | 9 000 | 01.25 | සුරංගි (ණය හිමි) | 400 | 7 600 |
| | | | | 01.26 | විජිත (ණය හිමි) | 600 | 11 400 |
| | | | | 01.27 | බැංකු (ඉමාෂා) | | 9 000 |
| | | | | 01.31 | ශේෂය ප/ගෙ | | 282 600 |
| | | 400 | 420 600 | | | 1000 | 420 600 |
| 02.01 | ශේෂය ඉ/ගෙ | | 282 600 | | | | |

හර බැංකු ගිණුම බැර

| දිනය | විස්තරය | වට්ටම් රු. | මුදල් රු. | දිනය | විස්තරය | වට්ටම් රු. | මුදල් රු. |
|---|---|---|---|---|---|---|---|
| 20XX.01.03 | මුදල් | | 20 000 | 20XX.01.08 | ගැනුම් | | 15 000 |
| 01.11 | ප්‍රියානි (ණයගැති) | 300 | 6 200 | 01.18 | කඩකුලී | | 2 000 |
| 01.27 | මුදල් (ඉමාෂා) | | 9 000 | 01.31 | ශේෂය ප/ගෙ | | 18 200 |
| | | | 35 200 | | | | 35 200 |
| 02.01 | ශේෂය ඉ/ගෙ | | 18 200 | | | | |

ගැනුම් ජ'නලය

| දිනය | ඉ. අංකය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|
| 20XX.01.06 | 45 | සුරංගි | 24 000 |
| 01.08 | 116 | විජිත | 20 000 |
| 01.31 | | ගැනුම් ගිණුමට හර කළා | 44 000 |

විකුණුම් ජ'නලය

| දිනය | ඉ. අංකය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|
| 20XX.01.05 | 01 | ප්‍රියානි | 19 000 |
| 01.09 | 02 | ඉමාෂා | 25 000 |
| 01.31 | | විකුණුම් ගිණුමට බැර කළා | 44 000 |

හර බැංකු ණය ගිණුම බැර

| දිනය | විස්තරය | වටිනාකම රු. | දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 20XX.01.12 | මුදල් | 3 000 | 20XX.01.04 | මුදල් | 50 000 |
| 01.31 | ශේෂය ප/ගෙ | 47 000 | | | |
| | | 50 000 | | | 50 000 |
| | | | 02.01 | ශේෂය ඉ/ගෙ | 47 000 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හර ප්‍රියානි (ණය ගැති) බැර

| දිනය | විස්තරය | වටිනාකම රු. | දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 20XX.01.05 | විකුණුම් | 19 000 | 20XX.01.10 | මුදල් | 11 600 |
| | | | 01.10 | වට්ටම් | 400 |
| | | | 01.11 | බැංකු | 6 200 |
| | | | 01.11 | වට්ටම් | 300 |
| | | | 01.31 | ශේෂය ප/ගෙ | 500 |
| | | 19 000 | | | 19 000 |
| 02.01 | ශේෂය ඉ/ගෙ ශේෂය | 500 | | | |

හර ඉමාෂා (ණය ගැති) බැර

| දිනය | විස්තරය | වටිනාකම රු. | දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 20XX.01.09 | විකුණුම් | 25 000 | 20XX.01.20 | මුදල් | 9 000 |
| | | | 01.31 | ශේෂය ප/ගෙ | 16 000 |
| | | 25 000 | | | 25 000 |
| 02.01 | ශේෂය ඉ/ගෙ | 16 000 | | | |

හර සුරංගි (ණය හිමි) බැර

| දිනය | විස්තරය | වටිනාකම රු. | දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 20XX.01.25 | මුදල් | 7 600 | 20XX.01.06 | ගැනුම් | 24000 |
| 01.25 | වට්ටම් | 400 | | | |
| 01.31 | ශේෂය ප/ගෙ | 16 000 | | | |
| | | 24 000 | | | 24 000 |
| | | | 02.01 | ශේෂය ඉ/ගෙ | 16 000 |

හර විජිත (ණය හිමි) බැර

| දිනය | විස්තරය | වටිනාකම රු. | දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 20XX.01.26 | මුදල් | 11 400 | 20XX.01.08 | ගැනුම් | 20 000 |
| 01.26 | වට්ටම් | 600 | | | |
| 01.31 | ශේෂය ප/ගෙ | 8 000 | | | |
| | | 20 000 | | | 20 000 |
| | | | 02.01 | ශේෂය ඉ/ගෙ | 8 000 |

හර ප්‍රාග්ධන ගිණුම බැර

| දිනය | විස්තරය | වටිනාකම රු. | දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 20XX.01.31 | ශේෂය ප/ගෙ | 200 000 | 20XX.01.01 | මුදල් | 200 000 |
| | | 200 000 | | | 200 000 |
| | | | 02.01 | ශේෂය ඉ/ගෙ | 200 000 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හර **දුන් වට්ටම් ගිණුම** බැර

| දිනය | විස්තරය | වටිනාකම රු. | දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 20XX.01.31 | ණය ගැති | 400 | 20XX.01.31 | ශේෂය ප/ගෙ | 700 |
| 01.31 | ණය ගැති | 300 | | | |
| | | 700 | | | 700 |
| 02.01 | ශේෂය ඉ/ගෙ | 700 | | | |

හර **ලැබූ වට්ටම් ගිණුම** බැර

| දිනය | විස්තරය | වටිනාකම රු. | දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 20XX.01.31 | ශේෂය ප/ගෙ | 1 000 | 20XX.01.31 | ණයහිමි | 1 000 |
| | | 1 000 | | | 1 000 |
| | | | 02.01 | ශේෂය ඉ/ගෙ | 1 000 |

හර **ගැනුම් ගිණුම** බැර

| දිනය | විස්තරය | වටිනාකම රු. | දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 20XX.01.31 | මුදල් | 85 000 | 20XX.01.31 | ශේෂය ප/ගෙ | 144 000 |
| 01.31 | බැංකු | 15 000 | | | |
| 01.31 | ණය හිමි | 44 000 | | | |
| | | 144 000 | | | 144 000 |
| 02.01 | ශේෂය ඉ/ගෙ | 144 000 | | | |

හර **විකුණුම් ගිණුම** බැර

| දිනය | විස්තරය | වටිනාකම රු. | දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 20XX.01.31 | ශේෂය ප/ගෙ | 194 000 | 20XX.01.05 | මුදල් | 150 000 |
| | | | 01.31 | ණයගැති | 44 000 |
| | | 194 000 | | | 194 000 |
| | | | 02.01 | ශේෂය ඉ/ගෙ | 194 000 |

හර **කඩකුලී ගිණුම** බැර

| දිනය | විස්තරය | වටිනාකම රු. | දිනය | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|---|
| 20XX.01.08 | මුදල් | 2 000 | 01.31 | ශේෂය ප/ගෙ | 4 000 |
| 01.18 | බැංකු | 2 000 | | | |
| | | 4 000 | | | 4 000 |
| 02.01 | ශේෂය ඉ/ගෙ | 4 000 | | | |

සමනල ව්‍යාපාරය

20XX.01.31 දිනට ශේෂ පිරික්සුම

| විස්තරය | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| මුදල් | 282 600 | |
| බැංකු ශේෂය | 18 200 | |
| ප්‍රාග්ධනය | | 200 000 |
| දුන්වට්ටම් | 700 | |
| ලැබූ වට්ටම් | | 1 000 |
| ගැනුම් | 144 000 | |
| විකුණුම් | | 194 000 |
| කඩකුලී | 4 000 | |
| ණයගැති - ප්‍රියානි | 500 | |
| ඉමාෂා | 16 000 | |
| ණයහිමි - සුරංගි | | 16 000 |
| විජිත | | 8 000 |
| බැංකු ණය | | 47 000 |
| | 466 000 | 466 000 |

## ක්‍රියාකාරකම 01

පහත දැක්වෙන ශේෂයන් ඇතුළත් කර කෝසලගේ ව්‍යාපාරයේ 20XX.09.30 වන දිනට ශේෂ පිරික්සුම පිළියෙල කරන්න.

| | රු. |
|---|---|
| ණයගැතියෝ | 80 000 |
| ස්ථාවර තැන්පතු | 158 000 |
| ණයහිමියෝ | 60 000 |
| දුන් වට්ටම් | 4 000 |
| ගැනුම් | 250 000 |
| යන්ත්‍ර උපකරණ | 120 000 |
| ලද වට්ටම් | 9 000 |
| බැංකු අයිරාව | 15 000 |
| වේතන | 20 000 |
| 20XX.01.01 දිනට ප්‍රාග්ධනය | 200 000 |
| පොලී ආදයම් | 8 000 |
| මුදල් | 40 000 |
| විකුණුම් | 380 000 |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 02

නිමි ඇඳුම් මිලට ගෙන නැවත විකිණීම සිදුකරන තිසාරාගේ ව්‍යාපාරයේ 20XX.03.31 දිනට පහත දැක්වෙන ශේෂයන් පැවතුණි.

| | | රු. |
|---|---|---|
| අත මුදල් | | 80 000 |
| බැංකු මුදල් | | 60 000 |
| ණය ගැතියෝ | - පුබුදු | 50 000 |
| | කුමුදු | 40 000 |
| ප්‍රාග්ධනය | | 150 000 |
| ණය හිමියෝ | - අනුෂ්කා | 45 000 |
| | කණිෂ්කා | 35 000 |

20XX මාර්තු මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

**ණයට ගැනුම්**

| දිනය | ඉන්වොයිසි අංකය | මුළු වටිනාකම රු. | වෙනත් තොරතුරු |
|---|---|---|---|
| 20XX.03.05 | 45 (අනුෂ්කා) | 38 000 | අඩුකළ වෙළඳ වට්ටම 10 % |
| 20XX.03.08 | 56 (කණිෂ්කා) | 42 000 | |
| 20XX.03.12 | 48 (අනුෂ්කා) | 34 000 | අඩුකළ වෙළඳ වට්ටම 5 % |
| 20XX.03.18 | 59 (කණිෂ්කා) | 25 000 | අඩුකළ වෙළඳ වට්ටම 4 % |

**ණයට විකුණුම්**

| දිනය | ඉන්වොයිසි අංකය | වෙනත් තොරතුරු |
|---|---|---|
| 20XX.03.07 | 62 (පුබුදු) | එකක් රු. 1 500 බැගින් කමිස 20කි. |
| 20XX.03.10 | 63 (කුමුදු) | එකක් රු. 2 000 බැගින් කලිසම් 25කි. |
| 20XX.03.15 | 64 (පුබුදු) | එකක් රු. 600 බැගින් ළමා ඇඳුම් 40කි. |
| 20XX.03.20 | 65 (කුමුදු) | එකක් රු. 1 800 බැගින් සාරි 20කි. |

ණයට විකුණුම් සිදුකිරීමේ දී 10 % ක වෙළඳ වට්ටම් ලබා දීම ව්‍යාපාරයේ විකුණුම් ප්‍රතිපත්තිය වේ.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

ලැබීම්වලට අදාළ තොරතුරු

| දිනය | මුදල් රු. | චෙක්පත් රු. | වෙනත් තොරතුරු |
|---|---|---|---|
| 20XX.03.02 විකුණුම් | 20 000 | 5 000 | චෙක්පත එදින ම බැංකුවේ තැන්පත් කළා. |
| 03.03 පුබුදුගෙන් | 8 500 | ____ | |
| 03.06 කුමුදුගෙන් | ____ | 12 400 | මෙම චෙක්පත 20XX.03.07 වන දින බැංකුවේ තැන්පත් කරන ලදි. |
| 03.07 පුබුදුගෙන් | 16 000 | 12 000 | මෙම චෙක්පත 20XX.03.10 වන දින බැංකුවේ තැන්පත් කරන ලදි. |
| 03.13 කුමුදුගෙන් | 8 000 | ____ | |

ගෙවීම්වලට අදාළ තොරතුරු

| දිනය | මුදල් රු. | චෙක්පත් රු. |
|---|---|---|
| 20XX.03.09 අනුෂ්කාට | | 13 000 |
| 03.10 කණිෂ්කාට | 15 400 | ____ |
| 03.11 ගැනුම් | 16 000 | 14 000 |
| 03.20 වැටුප් | 8 000 | 12 000 |
| 03.22 කණිෂ්කාට | ____ | 15 200 |

අවශ්‍ය වන්නේ,

01. මුදල් පොත
02. බැංකු ගිණුම
03. ගැනුම් ජ'නලය
04. විකුණුම් ජ'නලය
05. අදාළ ලෙජර් ගිණුම්
06. 20XX.03.31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කිරීම



නොමිලේ බෙදා හැරීම සඳහා ය.